# දකුණු ලක සිංහරාජ අඩවිය, මුලටියන රක්ෂිතය, රම්මලේ කන්ද යන සීමාවන් ආශ්‍රිත ජනයා තුළ පවතින්නා වූ රජ්ජුරු බණ්ඩාර බස්නාහිර දේව ඇදහිල්ල පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

**තරුෂිකා එම්.ජී.ආර්.**[1]

දකුණු ලක සිංහරාජ අඩවිය, මුලටියන රක්ෂිතය, රම්මලේ කන්ද යන සීමා ප්‍රදේශයන් ආශ්‍රිත ජනයා හා බද්ධ වී ඇති දේව සංකල්ප අතර වන රජ්ජුරු බණ්ඩාර බස්නාහිර දේව සංකල්පය කෙතෙක් දුරට මෙම ජන ජීවිතය තුළ බද්ධ වී ඇති ද යන්න මෙම පර්යේෂණයෙහි අරමුණ වෙයි. මෙහි දී ක්ෂේත්‍ර අධ්‍යනය සහ සම්මුඛ සාකච්ඡා, ද්විතීයික මූලාශ්‍රයන් ද යොදා ගැනුණි. නෙලුගල ප්‍රදේශයෙහි අතීතයේ ඔටුනු පලන් බණ්ඩාර නම් රජකෙනෙකු විය. ඉතා යහපත්ව ආදර්ශ සම්පන්න පාලනයක් ගෙනගිය ඒ රජ්ජුරු බණ්ඩාරයන්ට මරණින් පසු දේවත්වයක් ආරෝපණය වූ බැව් ජනප්‍රවාදයන්හි දක්වේ. මෙම බස්නාහිර දේවියන් උදෙසා කරවන ලද ප්‍රධාන දෙවොල ඉදිවූයේ එළමල්දෙණි රාජ මහා විහාරයේ ය. බණ්ඩාර දෙවියන් විෂයෙහි ලෙඩ රෝග සඳහා පිහිට පැතීම, නඩුහබ ජයග්‍රහණ ලබාගැනීම, අලුතින්ගත් රථවාහන ආරක්ෂා කර දෙන ලෙස බාරහාර වීම් වේ. එමෙන් ම අසාධාරණයන් සඳහා සාධාරණත්වයක් ලබාගැනීම සඳහා දෙවියන් ඉදිරියෙහි පලි ගැසීම හෙවත් අවලාද සිදුකෙරේ. පූජා පැවැත්වීමට පෙර මස් මාංශයෙන් වැළකී, කිලිවලට හසුනොවී, ජලස්නානය කර පිරිසිදු විය යුතු ය. පූජාවන් බදාදා, සෙනසුරාදා දිනවල සිදුකරන අතර ඒ සඳහා පලතුරු පස් වර්ගයක්, බුලත් විසි එකක්, පොල් ගෙඩියක්, කපුරු, කැවිලි පස් වර්ගයක්, පඬුරු යන පූජා ද්‍රව්‍යයන් යොදාගනී. මේ ආකාරයෙන් බස්නාහිර දෙවියන් උදෙසා පඬුරු වෙන් කිරීම, පොල් ගැසීම සිදුකිරීමෙන් අනතුරුව තම ප්‍රාර්ථනා තුන්වේල, තුන් දවස්, හත්වේල, හත් දවස් යන්නට පෙර සඵල වන බවට ගැමියන් විශ්වාස කරනු ලබයි. රජ්ජුරු බණ්ඩාර බස්නාහිර දෙවියන් යනු විශාල වන අඩවියකට අරක්ගත්, විශාල බලයක්, තේජසක් ඇති වරදට දඬුවම් ලබාදෙන යහපතට ආශිර්වාද කරන කෙනෙකු බවත්, දේව අඩවියේ දී කටවරද්දා නොගත යුතු බවත් ප්‍රදේශවාසීන්ගේ බහුතර මතය වේ. සෑම වසරක ම දුරුතු පුරපසලොස්වක පොහොය දිනයේ දී සිදුකරන මුරුතැන් පූජාව, යක්දෙහි මඩුව නම් දේවතොවිලය රජ්ජුරු බණ්ඩාර බස්නාහිර දෙවියන් උදෙසා අදටත් සිදුකරයි. මේ ආකාරයට දෙවියන් ඉදිරියේ පුද පූජා පවත්වා දේව තේජස, ශක්තිය පවසා පිහිට සරණ පතන ගැමියෝ රජ්ජුරු බණ්ඩාර දෙවියන්ට විටෙක දක්වන්නේ බියකි. ඒ කෙසේ වුවද දේව වත්පිළිවෙත්, පුදපූජා කිරීමෙන් සහනයක්, සතුටක්, ආශිර්වාදයක් නිතැතින් ම ලැබෙන බව නම් ගැමියෝ දැඩි සේ විශ්වාස කරති. වර්තමානය වන විට ද රජ්ජුරු බණ්ඩාර බස්නාහිර දේව සංකල්පය දකුණු ලක ඉහත කී සීමාවන්හි ජනයා විසින් තම දුක්ගැනවිලි සඳහා පිහිටක් බලාපොරොත්තුවෙන් අදහනු ලබන බව නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද :** රජ්ජුරු බණ්ඩාර බස්නාහිර දෙවියන් , දේව සංකල්පය, දෙවියන්, පුදපූජා, ගැමියන්

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
roshanitharushika15@gmail.com